Department of Education Sabaragamuwa Province/ Weekly School

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

විෂය - ව්‍යාපාර සංඛ්‍යානය

සතිය - 4

ශ්‍රේණිය - 13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 10 - කළමනාකරණ තීරණ ගැනීමට සංඛ්‍යාන තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම භාවිත කරයි.

නිපුණතා මට්ටම 10.1 - නිෂ්පාදිතයක ගුණත්වය කෙරෙහි බලපාන විචලන අධ්‍යයනය කරයි.

- නිෂ්පාදිත භාණ්ඩයක හෝ සේවාවක අපේක්ෂිත පූර්ව නිශ්චිත ප්‍රමිතිය එහි ගුණත්වය වේ.
- නිශ්පාදිතයක් පූර්ව නිශ්චිත ප්‍රමිතියට අනුකූල නොවීමට බලපාන හේතු ආකාර දෙකකි.
  1.සසම්භාවී විචලන (අනුදත් විචලන/සම්භාවනා විචලන)
  2.සසම්භාවී නොවන විචලන (පැවරිය හැකි විචලන)
- සසම්භාවී ව ඇති වන,විචලනයට හේතුව හඳුනා ගෙන නිවැරදි කළ නොහැකි, දෝෂය නිවැරදි කිරීමකින් තොරව ස්වාභාවික නිවැරදි වීමක් වුවත් සිදු විය හැකි විචලන සසම්භාවී විචලන ලෙස හැඳින්විය හැකිය.
- විචලනයට හේතුව හඳුනා ගෙන නිවැරදි කළ හැකි,දෝෂය නිවැරදි කරන තාක් දෝෂය එලෙසම පවතින විචලන,පැවරිය හැකි විචලන ලෙස හඳුනාගත හැකිය.

**<u>අභ්‍යාස</u>**

1.සංඛ්‍යාන තත්ත්ව පාලනයේ ප්‍රයෝජන 4ක් ලියන්න.

2.නිෂ්පාදිත පාලනයට භාවිත කරන ශිල්පීය ක්‍රමය හා ක්‍රියාවලි පාලනයට භාවිත කරන ශිල්පීය ක්‍රමය වෙන් වෙන්ව දක්වන්න.